# පරිසර සම්පත් පැතිකඩ

587 C

මත්තෙගොඩ නැගෙනහිර

ඩී.කේ.එස්. කුමාරි

1.හැඳින්වීම

a) වසම හා අංකය - මත්තගොඩ නැගෙනහිර 587C

b) වපසරිය වර්ග කිලෝමීටර් 1.05

අක්කර 259.461

හෙක්ටයාර් 105

c) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය- හෝමාගම

d) ගොවි ජන හා කෘපනිස කොට්ඨාශය - 1/4/2/ මත්තෙගොඩ 2

e) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය - කහතුඩුව

f) පශු වෛද්‍ය නිලධාරි කොට්ඨාශය හෝමාගම

g) බීට්ටු වන කාර්යාල කොට්ඨාශය කළුතර

h) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කළුතර

i) වන ජීවීදෙපාර්තමේන්තුව -ගම්පහ

h) අඩවි වන කාර්යාල කොට්ඨාශය වග


i) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශය කොළඹ

ii ජනගහනය

මුළු ජනගහනය -4335 (උපුටා ගැනීම සම්පත් පැතිකඩ )

ස්ත්‍රී -2194

පුරුෂ -2141



(උපුටා ගැනීම 2024-2025 වසරේ සම්පත් පැතිකඩ)

iii ජනාවාසකරණයේ ස්වභාවය- අර්ධ නාගරික

iv දේශගුණික තොරතුරු

a) අක්‍ෂාංශ හා දේශාංශ පිහිටීම


උතුරු අක්ෂාංශ -6.84

නැගෙනහිර දේශාංශ -80.00

(b) උෂ්ණත්වය සාමාන්‍ය - 30.68 c
උපරිම - 32 c
අවමය - 29.8 c

(c) වර්ෂාපතනය - 390 mm

(d) සාපේක්ෂ ආර්ද්‍රතාව - 33 %




(v) පාංශු තොරතුරු



a) පසේ ස්වභාවය - වැලි පස වැලි සහ බොරළු ලෝමපස

b) පසේ වර්ගය - රතු කහ පොඩ්සොලික්

c) සුලබ පාෂාණ ස්ථිත්වය - ග්‍රැනයිට්

2 පරිසර සම්පත් පැතිකඩ පිළියෙල කිරීමේ අවශ්‍යතාව

i සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම

ii තිරසට සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම

iii පාරිසරික ගැටලු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම

iv පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය, සහභාගිත්වය හා අවබෝධය පුළුල් කිරීම

v සංවර්ධන යෝජනා හඳුනා ගැනීම හා පරිසර සත්‍යතා සමගාමී කිරීම

vi ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කර ගැනීම

vii අඛණ්ඩ මෙහෙයුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම ස්ථාපිත කිරීම

3 ස්වභාවික සම්පත් පැතිකඩ

I. භෞමික සම්පත්

a) වපසරිය /භූමි ප්‍රමාණය වර්ග

වර්ග කිලෝමීටර් 1.07

අක්කර -259.461

හෙක්ටයාර් -105

b) භූමි පරිහරණ සැලසුම්

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය

I. වී - මෙම වසමේ කුඹුරු ඉඩම් නොමැත

ii වෙනත් ධාන්‍ය බෝග -වෙනත් ධාන්‍ය බෝග නොමැත

iii අපනයන කෘෂි බෝග -පොල් වගාව අක්කර 25

iv භූමිය යෙදවුම්

1. ගොඩ ඉඩම් - හෙක්ටයාර් 104.882

2. මඩ ඉඩම් -මඩ ඉඩම් නොමැත

3 පුරන් වූ / අත්හැර දැමූ - පුරන් කුඹුරු නොමැත

c) පසේ ස්වභාවය හා සාපලායතාව -වැලි සහ බොරළු ලෝමපස

d) පාංශු බාදනයේ ස්වභාවය- මෙම වසමේ පාංශු බාදනය වාර්තා වී නොමැත

e) පාංශු හයනයේ ස්වභාවය- පාංශු හායනය සැලකිය යුතු ලෙස මෙම ප්‍රදේශයෙන් වාර්තා වී නොමැත.

ii ජලජ සම්පත්

මෙම වසමේ ගංගා, අතු ගංගා, ඇල මාර්ග, වැව්, පොකුණු, දිය උල්පත් නොමැති අතර අතර කුඩා ඇල මාර්ගයක් ඇත. එය වසම් මායම සනිටුහන් කරයි .

b) භූගත ජලය

- ළිං -දැනට පවතින ආරක්ෂිත ළිං ප්‍රමාණය -22ක් පමණ වාර්තා වී ඇත
  -පොදු ළිං 04
- නළ ළිං - වාර්තා වී නොමැත
- 

c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යයනයර්ෂාපතනය -280 m.m
- **වර්ෂා ක්‍රමය**

| **වර්ෂා ක්‍රමය** | **වැසි ලැබෙන කාල සීමාව** |
|---|---|
| **පළමුවන අන්තර් මෝසම් වැසි** | **මාර්තු /අප්‍රේල්** |
| **නිරිතදිග මෝසම් වැසි** | **මැයි / සැප්තැම්බර්** |
| **දෙවන අන්තර් මෝසම් වැසි** | **ඔක්තොම්බර් / නොවැම්බර්** |

d) වාරිමාර්ග කටයුතු -මහා වාරි ව්‍යාපාර හෝ කුඩා වාර ව්‍යාපාර මෙම වසමේ නොමැත

e) ජලයේ ගුණාත්මකභාවය -PH අගය 6.5-75- ළිං වල PH අගය 7 ට ආසන්න අගයක් ගනියි

f) ජල සුලභතාවය

මෙම වසමේ පවුල් වලින් 98% පමණ ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ජලය භාවිතයටගනී .පොදුවේ භාවිතයට ගන්නා පොදු ළිං 04 ක් පමණ තිබෙන අතර මෙම ළිංද ප්‍රජාවේ පරිහරණය සඳහා භාවිතයට ගනී .එබැවින් මෙම වසමේ ජල හිඟතාවයක් වාර්තා නොවේ .

iii වනාන්තර හා වන වගාවන්

a) වන වැස්මේ වපසරිය වන වැස්මක් නොමැත

b) සුලභ ශාක ලේඛනය

| | |
|---|---|
| පොල් | අක්කර 25 |
| කොස් | ගස් 84 |
| පුවක් | ගස්125 |
| අඹ | ගස් 570 |
| රඹුටන් | ගස් 400 |
| කෙසෙල් | ගස් 1003 |
| දෙල් | ගස් 48 |
| කොහොඹ | ගස් 35 |

c) දැවමය නොවන වන නිෂ්පාදන

- ආහාර සහ ආකලන

| ආහාර හා ආකලන | දේශීය ඖෂධ | ශාක සාර | අත්කම් අමුද්‍රව්‍ය | ඉදිකිරීම් අමුද්‍රව්‍ය | සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත |
|---|---|---|---|---|---|
| ඉඟුරු | ඉඟුරු | කෝමාරිකා | පෝටා වැල් | පොල් | හාතවාරිය |
| කහ | අමු කහ | | මඬු ගස් | පුවක් | විසිතුරු මල් |
| සේර | කෝමාරිකා | | කිතුල් | කොස් | පොල් |
| ගම්මිරිස් | නික | | පොල් | | විසිතුරු ශාත පත්‍ර |
| කුරුඳු | පාවට්ටා | | | | |
| පොල් | කරපිංචා | | | | |
| මිරිස් | රණවරා | | | | |
| කරපංචා | පොල්පලා | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **රම්පෙ** | **හාතවාරිය** | | | | |
| | **යකිනාරන්** | | | | |



,

d) වන විනාශ කිරීම් පිළිබඳ විස්තර- අදාළ නොවේ

e) වන වගා ව්‍යාපෘති - විස්තර හමු නොවේ

f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්- වන සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොමැත. (*භූමිය සීමිත වීම*)

iv ජෛව විවිධත්වය

a) ශාක ලේඛනය

| ශාක වර්ගය | ප්‍රමාණය |
|---|---|
| නැදුන් | 08 |
| බුරුත | 03 |

b) ශාඛ වර්ගීකරණය (දේශිය/ඒක දේශිය හඳුන්වාදුන් විදේශිය හෝ දේශිය, ස්වාභාවි කෘත විදේශිය හො දේශිය/ ආගන්තුක/ ආගන්තුක- ආක්‍රමණශීලි)

| දේශීය ශාක | ඒක දේශීය | හදුන්වාදුන් | ස්වාභාවික දේශීය හො | ආගන්තුක ශාක | ආක්‍රමණශීලී |
|---|---|---|---|---|---|

| | | විදේශීය/දේශීය | විදේශීය | | ශාක |
|---|---|---|---|---|---|
| කොහොඹ | හීං බෝවිටියා | ඇකේෂියා | නැත | හවරි නුග (ගිනිකූරු ගස්) | ගඳපාන |
| කුඹුක් | කැකුණ | ක්‍රිස්ටිනා | | ජපන් ජබර | |
| කඳුරු | ගොඩපර | රට පුවක් | | වයිඩේලියා | |
| කොස් | දියපර | කහ කරඳ | | | |
| වෙරලු | | | | | |
| රුක් අත්තන | | | | | |
| මුරුංගා | | | | | |
| කොස් | | | | | |

-

ආගන්තුක හා ආක්‍රමණශීලී




හඳුන්වා දුන් විදේශීය ශාක



c) අන්තරායට ලක් වූ කාණ්ඩ - අන්තරායට ලක් වූ කාණ්ඩ මෙම වසමේ නැත.

4 පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

1 කෘෂිකර්මය


G. N. DIVISION - 587 C MATTEGODA EAST
AGRARIAN SERVICE CENTER-KAHATUDUWA
Kitulahena
Mattegoda West
Brahkmanagama
Mattegoda Central - A
Mattegoda Central - B
Deepangoda
Salmal Place
1st Lane
2nd La
3rd Lane
4th Lane
LEDGEND
Home Garden
Other Land
Paddy
Coconut
GN Division Boundary
Road
Stream
Place
200 0 200 400 Meters
PREPARED BY LAND USE PLANNING OFFICE COLOMBO

a) ප්‍රධාන භෝග -මෙම වසමේ කුඹුරු ඉඩම් නොමැත

b) අතිරේක භෝග අතිරේක භෝග නොමැත


c) අපනයන භෝග -අපනයන භෝග ලෙස පොල් වගාව හඳුන්වාදිය හැකිය. මෙම වසමේ පොල් වගාව අක්කර 25ක පමණ පවතින අතර අක්කර 22 ක පමණ පොල් ඉඩමක් පිහිටා ඇත .

d) සුළු අපනයන භෝග-

| බෝග වර්ගය | අක්කර ප්‍රමාණය |
|---|---|
| ගම්මිරිස් | අක්කර 0.60 |
| බුලත් | අක්කර 0.40 |
| ඉඟුරු | අක්කර 0.20 |


e) වෙනත් වාණිජ භෝග- වෙනත් වාණිජ භෝග නොමැත.

f) රසායනික පොහොර යෙදුම් -පොල් වගාව සඳහා රසායනික පොහොර භාවිතා කරයි




-

g) පලිබෝධනාශක යෙදවුම්




g)

h) සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්

වර්තමානයේ දක්නට නොමැති වුවත් බෝහෝ ජනාවාස ඉදිවීමට ප්‍රථම හේන් වගාව වසම තුල අතීතයේ තිබු බවට පැරන්නන් විසින් පවසයි.කැළෑ එලිකර පසුව ගිනි තබා නැවුම් පසේ සරුවට ,අල, බතල, මිරිස්, ඇතුලු වගාවන් සිදු කර ඇත. යළ හා මහ කන්නයේ වර්ශාපතනයන්ට අනුවර්තනය වන සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු සිදුකොට ඇත

සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු වලදි රසායනික පොහොර භාවිතය හා කෘමිනාසක,භාවිතය ඉතා අවම මට්ටමක පැවත ඇත, වල් පැලෑටි ඉවත් කිරිම සදහා මිනිස් ශ්‍රමය යොදාගත් අතර වගාවන් සදහා කාබනික පොහොර භාවිතය බහුල වශෙයෙන් සිදුකොට ඇත. මෙම වසම තුල හේන් වගාව කිරීමේදි සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළීවෙත් ලෙස

- කන්න අතරමග අතුරු බෝග වගාව සිදුකොට ඇත

I)නවීන කෘෂිකාර්මික පිළිවෙත්

- බිම් සැකසීම සඳහා අත්ට්‍රැක්ටරය සහා නවින යන්ත්‍රොපකරණ භාවිතය
- රසායනික පොහොර යෙදුම්

j) යහපත් කෘෂිකාර්මික පිළිවෙත්(GAP)- මෙම සහතිකය ලබාගත් ගොවීන් වසම තුළ නැත.

(K) කෘෂිකාර්මාන්තය කෙරෙහි වන අභියෝගතා හා දුෂ්කරතා (ස්වාභාවික ආපදා/කෘමි හා පළිබෝධ බලපෑම්)

පොල්වගාව සඳහා රතුකුරුමිනියගෙන් සිදුවන හානි , කොල සුදු විමේ රෝගය මෙන්ම වදුරන් වැනි සතුන් මගින් සිදු කරනු ලබන අස්වනු විනාශය

ii) පශු සම්පත් කර්මාන්තය

a) සුලභ පසු කර්මාන්ත යේදුම්
b) පශුකරමාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබඳ විස්තර (ස්වාභාවික, කෘතිම, මිශ්‍ර)
**c) සුලබ පශු කර්මාන්ත යෙදවුම්**

| | ප්‍රමාණය | සත්ත්ව වර්ගය | යොදාන්නා<br><br>කාර්යය | හිමිකරුවන් ගණන | ඇති කිරීමේ ක්‍රමය | ආහාර |
|---|---|---|---|---|---|---|
| එළ ගව | 5 | සහිවාල් | කිරි | 01 | නිදැලි | ස්වාභාවික, |
| කුකුළු | 80 | | බිත්තර | 09 | නිදැලි | ස්වාභාවික, |

iii ධීවර කර්මාන්තය

a) ප්‍රධාන ධීවර අයිතම -ධීවර කර්මාන්තය සිදු නොකරයි

b) ධීවර කාර්මික පරිවාර අදාල නොවෙයි

c) ධීවර කර්මාන්තයේ කෙරෙහි පවතින අභියෝග හාදුෂ්කරතා- අදාල නොවෙයි.

iv ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය

- පුනර්ජනනීය ශක්ති ප්‍රභවයේ
- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභවයේ


- . පුනර්ජීවන ශක්ති ප්‍රභව

මෙවා ස්වභාවයෙන්ම නැවත නිපදවිය හැකි, නොමදව සපයන ශක්ති ප්‍රභව වේ.

උදාහරණ:


- සූර්ය ශක්තිය

**පුනර්ජනනීය ශක්ති ප්‍රභවයක් ලෙස වසම තුල සූර්ය පැනල භාවිතය සිදු වේ .** ඒ සඳහා ඇති කැමත්ත හා සූදානම වැඩි වෙමින් ඇත




ප්‍රභව වේ.

පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව  ලෙස; දර හා පෙට්‍රෝලියම් ප්‍රභවයන් භාවිතය සිදු   වේ





ස්වාභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම සැපයුම අනුපාත විශ්ලේශණය

ඩීසල්/ ගෑස්

| | 2005 | 2010 | 2015 | 2020 |
|---|---|---|---|---|
| පුනර්ජනනීය නොවන ශක්ති සම්පත් | 3 | 4.5 | 6 | 10.5 |

| | | | | |
|---|---|---|---|---|
| පුනර්ජීවන ශක්ති සම්පත් | .27 | .6 | .75 | 1.2 |




b) පුනර්ජනනීය ශක්ති ප්‍රභවයේ යෙදුම් සඳහා ප්‍රජාවේ දායකත්වය

වසමට අදාලව පවතින්නේ සූර්ය පැනල පමණි. ඒ සඳහා ඇති කැමත්ත හා සූදානම වැඩි වෙමින් ඇත.

5.සමාජ සංස්කෘතික සන්දර්භය

1. පරිසර ගැටලු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණය යාන්ත්‍රණය

පරිසර ගැටලු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණය යාන්ත්‍රණය

පරිසර ගැටලු සම්බන්ධව ප්‍රජාවේ අවබෝධය පිළිබඳ සලකා බලන විට මධ්‍යස්ථ භාවයක් පෙන්නුම් කරයි .සමාජ පසුබිම තුළ විවිධ බුද්ධ මට්ටම් සහිත ප්‍රජාවත් ජීවත් වෙයි .ඇතැම් පිරිස් ඉහළ බුද්ධි මට්ටමකින් කටයුතු කරන අතර තවත් පිරිසක් පරිසරයට ගැටලු ඇති කරමින් ජීවිකාව පවත්වාගෙන යයි .විශේෂයෙන්ම බණ්ඩාරනායක පුර පස්වන පටු මගේ ප්‍රජාව ඔවුන්ගේ නිවාස වලින් බැහැර කරන අපවිත්‍ර ජලය ඇලමාර්ගයට මුදා හැරීම නිසා එම ඇල මාර්ගයේ ජලය ලබාගෙන කුඹුරු වගා කරන ගොවීන්ටද දැඩි බලපෑමක් එල්ල කරයි .මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඉඩම් කැබිලි කුඩා වී යාමත් වෝටර් බේස්ට් බලවල් ඉක්මනින් පිරී යාමත් නිසා ඔවුන් ඇළ මාර්ගයට

අපවිත්‍ර ජලය මුදා හැරීමට පුරුදු වී සිටි.තවද මෙම වසමේ පරිසර ගැටලුවක් ලෙස පල්දෝරු පද්ධතියෙන් නිකුත් කරන අපවිත්‍ර ජලය ඇල්මාර්ගයට මුදා හැරීම නිසා ගොවීන් දැඩි ලෙස ආසාත්මිකතාවන්ට මුහුණ පාමින් සිටි .පල්දෝරු පද්ධතියේ අවසානයට පෙරී එන ජලය ක්ලෝරීන් මිශ්‍රණයක් එකතු කරමින් ඇළට මුදා හරි .නමුත් එහි ක්‍රියාකරු එය ප්‍රමිතියකට අනුව සිදු නොකරන බව අපිටද නිරීක්ෂණය විය .මෙම අපවිත්‍ර ජලය එකතුවෙන ඇලමාර්ගයෙන් කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයකට ජලය ලබා ගන්නා අතර පල්දෝරු පද්ධතියත් බණ්ඩාරනායක පුර පස්වන පටු මගේ ඇතැම් නිවසියනුත් සිදුකරන ජලය අපවිත්‍රතා මගින් පරිසරයට සිදු කරන බලපෑම අතිමහත්ය .

මෙයට විකල්ප විසඳුම් සෙවීමේදී මෙම පල්දෝරු පද්ධතිය මගින් නිකුත් කරන ජලය නිසි ප්‍රමිතියකට අනුව බැහැර කිරීම මගින් ඇළ මාර්ගය අපවිත්‍ර වීම නවතාලීමට හැකියාව ලැබේ තවද ඇතැම් නිවසියන් විසින් තමාගේ ඉඩමේ බේස් වෝට දැමීම සඳහා නිසි ක්‍රමවේදයකට අනුව තමන්ගේ ඉඩම තුළ බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසිය යුතුය .

අප විසින් clean SriLanka වැඩසටහන සමගාමීව පවත්වන ලද ශ්‍රමදාන වැනි වැඩසටහන්වලදී පෙනී ගියේ ප්‍රධාන මාර්ගය දෙපස නොදිරන අපද්‍රව්‍ය (බෝතල් ,බියර්ටින් ,පොලිතින් ) බැහැර කිරීම නිසා පරිසරයට විශාල බලපෑමක් ඇති කරයි .මෙයට විකල්ප විසඳුමක් ලෙස ප්‍රධාන මාර්ගයේ ඉදිරිපිට සිටින නිවැසියන්ට ඔවුන්ගේ නිවාස ඉදිරිපිට ඇති අප ද්‍රව්‍ය එකතුකර ප්‍රාදේශීය සභාව මගෙන් කසල එකතු කරනු ලබන වාහනයට ලබා දෙන ලෙසයි.

තවද හිස් ඉඩම් හිමියන්ගේ ඉඩම් වලට අවට නිවැසියන් විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම සිදුකරයි .මෙහිදී නොදිරන අපද්‍රව්‍ය විශාල වශයෙන් බැහැර කිරීම සිදුකරයි විශේෂයෙන් පොලිතීන් බෝතල් වැනි නොදිරන අපද්‍රව්‍ය සුලභව තිබෙන බව නිරීක්ෂණය විය .මිනිසුන්ගේ ආකල්ප සංවර්ධනය නොවීම විශාල ගැටලුවක් ලෙස පෙනී යයි .මේ මගින් ඩෙංගු චිකන් ගුණියා වැනි රෝග බෝවීමේ අවදානමක් පවතී .මේ සඳහා විකල්ප විසඳුම් ලෙස අප විසින් ඉඩම් හිමිකරුවන් සොයා ගොස් ඔවුන්ව දැනුවත් කරන ලදී.

ii)සාම්ප්‍රදායික පරිසර දැනුම හා පරිවාර

a ජනප්‍රවාද පරිසරයේ සීඝ්‍ර නාගරීකරණය හා විවිධ සංක්‍රමණික නේවාසිකාගාර සඳහා විවිධ ප්‍රදේශවලින් සංක්‍රමණය වීම නිසා විවිධ සාම්ප්‍රදායික දැනුමැති පුද්ගලයන් ගහන වෙයි

b) ජනගෘහිතය සම්බන්ධ වාර්තා වී නොමැත

c) දේශීය වෛද්‍ය ක්‍රම සම්බන්ධ වාර්තා වී නොමැත.

iii සාම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය -වාර්තා වී නොමැත

iv පරිසර ගැටලු සඳහා යෙදුණු විසඳුම

වසමට අදාල පරිසර ගැටලු

-කසල කළමනාකරණය නොමැතිවීම:

- ගෘහස්ථ හා ව්‍යාපාරික කසල නිසි ආකාරයට වෙන් නොකිරීි

- කසල ගොඩවීම් නිසා වායු දූෂණය හා මදුරුවන්, මැස්සන් වැඩිවී ශබ්ද දූෂණය

- වාහන, කර්මාන්ත සහ වැඩබිම්වලින් නිර්මාණය වන අධික ශබ්දය.

විසඳුම්

*clean ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ කසල කළමනාකරණය පිළිබඳව සෑම මසකම දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්විම

*ප්‍රධාන මාවත් මෙන්ම සියලුම පටුමගවල් පදිංචි කරුවන් විසින් පිරිසිදුව තබා ගැනිම

*අපද්‍රව්‍ය ඇලවල් වලට මුදා හැරිම වැලකිමට රජයේ නිළධාරින් සෘජුව මැදිහත් විම හා අවශ්‍ය කටයුතු කිරිම

6.කාලීන පාරිසරික අර්බුද හා අභියෝග

i වන විනාශය/ කැලෑ එළි කිරීම වන විනාශය හෝ කැලෑ එලි පෙහෙළි කිරීම මෙම වසමේ නොමැත.

ii ජල හිගය

වසමේ සෑම නිවසකටම පාහේ පානීය ජලය ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා ගෙන තිබේ .තවද නියං කාලයේදී වුවද පොදුළිං හතරක් පමණ වස්මේ පිහිටා තිබෙන බැවින් ඒවා ද ප්‍රයෝජනයට ගනී

වසමේ ආරක්ෂිතළිං වලින් විසි දෙකක් භාවිතයට ගනී. එම නිසා වසමේ ජල හිඟතාවයක් වාර්තා වී නොමැත .

iii පාංශු හායනය පාංශු හායනය වාර්තා වී නොමැත

iv කැලි කසල බැහැර කිරීම

මෙම ග්‍රාමලධාරී වසමේ නිවාස 1017පමණ තිබෙන අතර සීඝ්‍රයෙන් ජනාකීර්ණ වීම නිසා ගැටලු රාශියකට මුහුණ දී තිබේ .සුපිරිවෙළඳ සංකීර්ණ සහ ගොඩනැගිලි ඉදි වෙමින් පවතී .තවද ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය පිහිටා තිබීමත් නිසා විශාල ජන සනත්වයක් වසමේ පවතී.තවද මෙම වසමේ පර්චස් 10යේ ඉඩම් වල නිවාස දෙකක් පමණ පිහිටා ඇත. එ...

එහෙත් ඩෙංගු පරීක්ෂාව වැනි වැඩසටහන් වලදී නිවාස පරීක්ෂාව සිදු කරන අවස්ථාවල නිරීක්ෂණය වූයේ නොදිරන අපද්‍රව්‍ය නිවාස වල එකතු වී ඇති බවයි.එම නිසා කසල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

වැදගත් වෙයි .තවද නිවාස වල එකතුවෙන පොලිතීන් ප්ලාස්ටික් වැනි නොදිරන අපද්‍රව්‍ය පුළුස්සා දැමීමට ඇතැම් නිවැසියන් පුරුදු වී සිටි .මේ නිසා දීර්ඝ කාලීන ලෙඩ රෝග ඇතිවීමේ අවදානමක් තිබේ .

iv දේශගුණික විපර්යාස වල බලපෑම

ස්වාභාවික වන වැස්මේ හිඟවීම නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑමේ සන්තර්පයට මුහුණ දී තිබේ .ඝන කොන්ක්‍රීට් වැස්ම නිසා ඉන් මුදා හරින තාපය ස්වභාවිකව අවශෝෂණය නොවේ .එක තැන සංසරණය වන බවක් නිරීක්ෂණය වේ .

07 පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපත කරගැනීම

i පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපත කරගැනීම

i පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

මෙම වසමේ පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව සම්බන්ධව සලකා බැලීමේදී මේ වන විටත් වසමේ පිරිසිදු පානීය ජලය ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ලබාගෙන ඇති බව ජනහානිවාස සංගණනයේදී නිරීක්ෂණය විය. තවද වසමේ ආරක්ෂිත ළිං සහ පොදු ළිං හතරක් පමණ පවතින අතර ග්‍රාමීය ජනතාව ඒවාද භාවිතයටට ගනී .2030 වර්ෂය වන විට ජලය අඩු මිලකට ලබා ගැනීමට හැකි වන්නේ නම් වසමේ ප්‍රජාවට එය විශාල සහනයක් ලෙස සැලකියය හැකියි .

සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධව සලකා බැලීමේදී වසමේ හඳුනාගත් පවුල් තුනක් පමණ මේ වන විට පොදු වැසිකිලි භාවිතා කරන අතර අනෙකුත් සියලුම පවුල් වලට ආරක්ෂාකාරී වැසිකිලි පද්ධතියක් පවතින බව ජනහා නිවාස සංගණනයේදී පැහැදිලි හඳුනාගත හැකි විය .නමුත් වසමේ විශාල ලෙස බෝඩිං කාමර පවතින බැවින් ඒ අයද පොදුවේ වැසිකිලි භාවිතා කරයි. ජනගහනයට සාපේක්ෂව වැසිකිලි පවතින බව අපට නිරීක්ෂණය විය .

ii ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

තිරසර සංවර්ධන අභිමතාර්ථ සපත කරගැනීමේදී ධරණීය හා පුනිත්‍ය බල ශක්තිය භාවිතය සම්බන්ධව 2030 වර්ෂය වන විට සියලු දෙනාට අඩු මිලකට ලබාගතහැකි විශ්වාසදායි නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ වේ නම් වසමේ අඩු ආදායම්ලාභී ජනතාවගේ ආර්ථිකයට විශාල ලෙස යහපත් බලපෑමක් ඇති කරයි .2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගේ කොටසක් හෝ ඉහළ නැංවීම අරමුණයි .වසමේදැනටමත් පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශයක් ලෙස සූර්ය පැනල් නිවාස කිහිපයකම භාවිතයට ගනී .ඉදිරියේදී ප්‍රජාව දැනුවත් කර ගුණාත්මක ලෙස ඉහළ නංවා ගැනීමට හැකි වෙතැයි අපේක්ෂාකෙරේ .සූරිය පැනල් ක්‍රියාත්මක වීමේදී පරිසරය දූෂණයට ලක්නොවේ .2030 වන විට පිරිසිදු බලශක්ති පර්යේෂණ සහ තාක්ෂණ , පුනර්ජනනීය

බල ශක්තිය ද ඇතුළත්ව බලශක්තිය කාර්යක්ෂමතාව සහ උසස් සහ පිරිසුදු පොසිල තාක්ෂණය සහ බලශක්තිය යටිතල පහසුකම් සහ පිරිසිදු බලශක්ති තාක්ෂණය සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය වැඩිදියුණු කරගත යුතුයි ....

iii තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටාවන්

මෙම වසමේ සංවර්ධනය හා ධාරිතාවන් පිළිබඳ සැලකිලිමත් වෙමින් තිරිසර පරිභෝජනය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම ක්‍රියාවට නැංවිය යුතුයි .

සිල්ලර හා පාරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යෑම් අවම කරමින් නිෂ්පාදන හා සැපයුම් දාමයන්ගේ සිදුවන්නා වූ අපතේ යෑම් අවම කිරීම සඳහා කටයුතු කළයුතුයි .

අපද්‍රව්‍ය කළමනාකරන ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම සහ එමගින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන්නාවූ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ,ජලයට සහ පසට ඒවා මුදාහැරීම අවම කිරීම .

2030 වර්ෂය වන විට අප ද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම් මගින් අඩු කිරීම.

2030 වන විට මෙම වසමේ සිටින සියලු දෙනාට තිරසර සංවර්ධනය හා ස්වභාවධර්මය සමග සුසන් යෝගයෙන් යුත් ජීවන රටාවක් ගත කිරීම පිළිබඳ දැනුවත් භාවයක් ඇතිකිරීම.

IV දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම

කාලගුණික වෙනස්වීම් අවම කිරීම, ඒ අනුව හැඩ ගැසීම ,බලපෑම් අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය දැනුවත් භාවය ඉහල නැන්වීම් සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම .

මෙම වසමේ කාන්තාවන් තරුණයන් ඉලක්ක කර ගනිමින් කාලගුණික වෙනස්වීම් සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීමට සහ කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණය ප්‍රවර්ධන කිරීම .

V සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම් දායකභාවිතාව මෙම වසමට අදාල නොවේ

vi) බවුම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරිසර භාවිතාව - වසමට අදාලනොවේ

8.තිරසාර පරිසර සංවර්ධන හා පරිසර කළමනාකරණය යන්ත්‍රනයක් ස්ථාපිත කිරිම සඳහා නව අදහස් යෝජනා  නිර්දේශ

රාජ්‍ය හා පෞද්ගලික අංශ එක්ව

1 ඇළ මාර්ග හා පරිසරයට අපද්‍රව්‍ය මුදා හැරීම වලක්වා ලීමෙ නීති දැඩි කිරිම. **පාරිසරික උපද්‍රව ගණනාවක් ඇති වන නාගරීකරන අපද්‍රව්‍ය බැහර කිරිම සඳහා සුදුසු ක්‍රියාකාරි සැලස්මක් සහ යටිතල පහසුකම් දැනට ප්‍රමානවත් නොවේ. සීග්‍ර නාගරීකරනයේ හා කාර්මීකරණයේ සිදුවන වායු දූෂණය බරපතල ගැටලුවක්ව පවති. කර්මාන්ත ශාලා මගින් පිටවන විෂ  වායු මගින් පරිසර නියමයන් ඉක්මයමින් පවති.**

2.පාරිසරික සංරක්ෂණය සඳහා නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම

**3. පරිසර හිතකාමි නිෂ්පාදනයන් ප්‍රවර්ධනය සහ රසායනික පොහොර හා කෘමිනාෂක භාවිතය උදාසීන කිරිම**

**4.**වසමේ සෑම දෙනාටම සඳහා **පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සඳහා පිරිසිදු** වාතය  ලබාගැනීම්මට **වසම තුල ස්වාභාවික වන, වෘක්ෂලතා, සත්ව යන උරුමයන් හායනය විමට ඉඩ නොදි රැක ගැනිම**

**5 ස්වභාවය සම්පත් කායීක්ෂමව හා ඵලදායි ලෙස උපයෝජනය මගින් වසමේ ආර්ථික සංවර්ධනය මෙහෙයුම්වල තිරසාරභාවය ඉහළ නැංවිම පිණිස සැලසුමක් සකස් කළ යුතුයි.**

**6.** ගොඩනැගිලි හා **කර්මාන්ත ,මාර්ග ඇතුළු සියළුම ඉදිකිරීම් නියමිත** සැලැස්මක්, **ප්‍රමිතීන්ට අනුව** ක්‍රියාත්මක කිරීම